# ප්‍රතිකර්මය රෝගයට වඩා භයානකද?

# ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා

සංස්කරණය

ප්‍රදීප් පීරිස්

7

# කබලෙන් ලිපට වැටීම: කොවිඩ්-19 ප්‍රතිචාරය තුළ සංක්‍රමණික ඇඟළුම් කම්හල් සේවකයින්ගේ ජීවිතය

***කෞෂිණී දම්මලගේ***

## හැඳින්වීම

වසරකට වැඩිකාලයක් පුරාවට ගෝලීය වසංගතයක් වශයෙන් ව්‍යාප්තිය වන කෝවිඩ් 19 සියලු ක්ෂේත්‍ර කෙරෙහි තර්ජනාත්මකව බලපෑවේය. ජාතික සහ ගෘහස්ථ ආර්ථිකයන් එහි දැඩි බලපෑමට ලක්ව ඇති අතර, සමහර අවස්ථා වල ඒවා කඩා වැටීමට ආසන්න තත්වයට පත්වී තිබේ. වෛරසය විකාශනය වෙමින් පාලනය කළ නොහැකි ලෙස පැතිර යනවිට ඊට ප්‍රතිචාරයක් ලෙස සංචරණ සීමා හා සමාජ දුරස්ථ භාවය රැකීමේ විධිවිධාන හඳුන්වා දී ඇත්තේ වෛරසය පැතිරීම පාලනය කිරීමෙහිලා ඒවායෙහි සාර්ථකත්වය දැනටමත් අවබෝධ වී ඇති නිසාය. එසේ වුවත් ජීවිත රැකගැනීමට සිදුව ඇත්තේ ජීවනෝපායන් අනතුරේ හෙළීම මඟිනි. වෙනත් අංශ වල මෙන්ම ඇඟළුම් ක්ෂේත්‍රය තුළද වියදම් අඩුකර ගැනීම සඳහා කර්මාන්ත ශාලා යොමුව ඇත්තේ, ආයෝජකයින් වියදම් කපාහැරීම හේතුවෙන් ඉල්ලුම සීඝ්‍රයෙන් පහත බැස ඇති බව හා එම නිසා පාඩුව අවම කරගත යුතු බවට හේතු දැක්වීම තුළිනි. එම පදනම මත වැටුප් අඩු කිරීම් සහ රැකියා අහිමි කිරීම් සිදුකිරීම තුළ ශ්‍රමිකයා අන් කවරදාටත් වඩා අනතුරුදායක තත්වයකට පත්වී තිබේ. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ කොවිඩ් වසංගත අත්දැකීම තුළ ප්‍රාග්ධනය සහ ශ්‍රමය අතර සම්බන්ධතාවය මෙන්ම, එහිලා රාජ්‍යයේ මැදිහත්කරණ භූමිකාව පිළිබඳ විමසා බැලීමට මා යොමු වන්නේ මෙවැනි පසුබිමක් තුළය.

අප දැනටමත් දන්නා පරිදි මෙන්ම පූර්ව මූලාශ්‍ර වලද දක්වා ඇති පරිදි නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින් යනු සමාජයේ වෙසෙසින්ම ආන්තීකරණයට ලක්වූ කණ්ඩායමකි. මේ කෙරෙහි ඔවුන් පිළිබඳ ඇති සංස්කෘතික ආඛ්‍යාන සහ සමාජ ප්‍රතිමානයන් දැඩිව බලපා ඇති අතර, වසංගතය මඟින් තත්වය තවත් දරුණු අතට හරවනු ලැබ තිබේ. මෙම පරිච්ඡේදයේදී මාගේ අරමුණ වන්නේ 1) කොවිඩ් වසංගත තත්වය තුළ ඔවුන්ගේ ආර්ථික අත්දැකීම 2) කොවිඩ් වසංගතය නිසා ඔවුන්ගේ රැකියා සහ පෞද්ගලික ජීවිතය තුළ ඇති කරන ලද වෙනස්කම් හා එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ට මුහුණ පෑමට සිදුවූ අත්‍යන්ත දුෂ්කරතා 3) ඔවුන් පිළිබඳ සමාජයේ කලින් සිටම පැවති ආඛ්‍යාන නිසා වසංගත තත්වය තුළ ඔවුන් තවදුරටත් ආන්තීකරණය වූ අයුරු සහ 4) ශ්‍රමය අරබයා ප්‍රාග්ධනය සහ රජ්‍යයෙහි භූමිකාව යන ඒවා විමසා බැලීමයි. මගේ විශ්ලේෂණය ප්‍රාථමික සහ ද්විතියික ගුණාත්මක දත්ත මත පදනම් වේ.

## පසුබිම

1970 දශකයේ අග භාගයේදී ලංකාවට විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන් තැන් සිට නිදහස් වෙළඳ කලාප ‘නව ලිබරල් අවකාශයන්’ (Jayawardena, 2020) බවට පත්ව ඇත්තේ රැකියා අවස්ථා මඟින් ග්‍රාමීය කාන්තාව ආකර්ෂණය කරගැනීම තුළිනි. එතැන් පටන් අපනයන ආර්ථිකය මත පදනම්ව කාර්මීකරණයට සිදුකරන ලද දැවැන්ත විපරිවර්තනයෙහි කොඳු නාරටිය බවට මෙම කලාප පත්ව ඇත (Hancock, 2006, p. 1). හේවාමාන්නට අනුව (2020, p. 3) මෙම අවකාශයන් ඉතා චේතාන්විත ලෙස ස්ත්‍රීකරණය වීමෙහි දක්නට ලැබෙන්නේ පුරුෂාධිපති රාමුව තුළ කාන්තාව පිළිබඳ පවතින ‘කඩිසර දෑතක් හිමි’, ‘කීකරු’ හා ‘පවුලේ ද්විතීයික උපයන්නා’ යන දැක්මය. ගුණතිලක (2019) පවසන්නේ මෙසේ ස්ත්‍රිය යටත් කරගැනීම හරහා ගෝලීය ප්‍රාග්ධනය ලාභ උපයාගන්නා බවයි.

එමෙන්ම නිදහස් වෙළඳ කලාපයේ සේවයේ නියුතු කාන්තාවන් ආර්ථික හා සමාජමය වශයෙන් ආන්තීකරණය වූ පසුබිම් වලින් සහ සාපේක්ෂව අඩු අධ්‍යාපන මට්ටම් වලින් පැමිණෙන්නන් වේ (Hewamanne, 2017). එම නිසා ගෝලීය නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉල්ලා සිටින්නා වූ ආකාරයේ ‘ඵලදායී ශ්‍රමය’ සැපයීමට සුවිශේෂයෙන්ම සුදුසු අය බවට ඔවුන් පත්ව ඇත (Jayawardena, 2020). පිටස්තර පළාත් වලින් පැමිණ වෙළඳ කලාපයේ සේවයේ යෙදෙන ඔවුන් කුලී නිවාස වල ලැගුම් ගන්නේ බොහෝ විට පෞද්ගලිකව එම විය පැහැදම් දරා ගනිමිනි. මෙම කුලී නිවාස වල ඛේදජනක තත්වය විශාල වශයෙන් අවධානයට ලක්ව ඇත (මේ

සම්බන්ධයෙන් අදහසක් ලබාගැනීම සඳහා Hewamanne, 2003, 2017, 2019, 2018; Jayawardena, 2017, 2020; Hancock, Middleton, and Moore, 2012 යන මූලාශ්‍ර භාවිතා කළ හැකිය).

මෙවැනි දුෂ්කරතා තුළින් නිර්මාණය වන 'කලාපයේ යුවතිය' ගේ අනන්‍යතාවය සූරා කෑමට ලක්වන, කෙලෙසුනු සහ එම නිසා සංස්කෘතිකමය වශයෙන් ප්‍රශ්නකාරී එකක් ලෙස සමාජගත වී ඇත. ඔවුන් පිළිබඳ ඒ අනුව සිතනු ලබන්නේ ගණිකා වෘත්තිය, ගබ්සාවන් සහ මූලිකව තමාගේම අසංවර බව නිසා ප්‍රශ්න ගණනාවකට මැදිවූ පිරිසක් යන ප්‍රවර්ගයන් ආශ්‍රිතවය. අසල්වාසීන් විසින් ඔවුන්ට 'ජුකී කෑලි' යන්නත්, වෙළඳ කලාපයට 'වේ* කලාපය' යන්නත් අන්වර්ථ නාම ලෙස යොදා ඇත (Hewamanne, 2003; Jayawardena, 2017; Attanpola, 2006; Hancock, 2006).


කර්මාන්ත ශාලාව තුළ ඔවුන්ගේ ජීවිතයද මෙතරම්ම කටුකය. අදාළ ඉලක්ක සම්පූර්ණ කරගැනීම සඳහා එල්ල වන පීඩනයෙන් ඔවුහු නිරන්තරයෙන් පීඩා විඳිති. එසේම අනිවාර්ය අතිකාල සේවා මුර, අධීක්ෂකයින්ගේ වාචික සහ ශාරීරික හිංසනයට බඳුන් වීම සහ මෙම කරුණු නිසා ඇතිවන මානසික ආතතිය ඔවුන්ගේ දෛනික යථාර්ථය වේ. එබැවින් කාර්මික පද්ධතිය තුළ බලරහිත, යටත්වාසී වින්දිතයන් බවට ඔවුන් පත්ව ඇත (Jayawardena, 2017; Hancock, 2006).

මෙම සාකච්ඡාවෙන් ගම්‍ය වන කරුණු දෙකකි: පළමුවැන්න, නිදහස් වෙළඳ කලාපයේ සේවයේ නියුතු කාන්තාවන් කලාපයේ සේවිකාවන් වීම නිසා සහ කාන්තාවන් වීම නිසා ද්විත්ව ආකාරයට අනතුරට ලක්වීමේ ප්‍රවණතාවයක් පවතින බවය. දෙවැන්න, සිය ගම් වල බලාත්මක ග්‍රාමීය සහ පවුල මූලික පුරුෂාධිපත්‍යයෙන් යම් දුරකට නිදහස් වීමට ඔවුන්ට හැකියාව ලැබී තිබුණත්, නව තත්වය තුළ කාර්මික පුරුෂාධිපත්‍යයේ සහ නිදහස් වෙළඳ කලාපයේ යටත්වාසී භාවයේ යදම් වලින් නැවත වාරයක් ඔවුන් බැඳ දමා තිබීමය. එම නිසා වෙනස් රාමුවක් තුළ වුවද ඔවුන්ගේ ආන්තීකරණය දිගින් දිගටම පවතින බව පෙනී යයි.

මෙම පරිච්ඡේදයේදී මගේ අරමුණ වන්නේ කොවිඩ්-19 වසංගත තත්වය තුළ ඇති කරන ලද නව හා වඩා තීව්‍ර වූ අනතුරුදායක තත්වයන් තුළ, මෙම කාන්තා ශ්‍රමිකයින් තවදුරටත් අනතුරට ලක්වූයේ කෙසේද යන්න විභාග කිරීමයි. ඒ හරහා මා උත්සාහ ගන්නේ කොවිඩ්-19 වසංගතය වැනි බාහිර උවදුරක් හමුවේ සමාජයේ පවතින ආන්තීකරණයන් තවදුරටත් තීව්‍ර වන්නේ කෙසේද යන්න සහ, එම අන්තයන්ගේ ජීවත් වන්නන්ට එමගින් බලපෑම් ඇති කරන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමටය.

## ආර්ථික ගැටළු සහ පැවැත්ම සඳහා අරගලය

වර්ෂ 2021 මාර්තු 20 වනදා දිවයිනටම බලපැවැත්වෙන පරිදි ඇඳිරි නීතිය ප්‍රකාශ කිරීමත් සමඟ, නිදහස් වෙළඳ කලාප තුළ සිය නිවෙස් වලට යාගත නොහැකිව කුලී නිවාස වල සිරවූ සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ සංඛ්‍යාව 275,000 ක් පමණ වූ බවට තක්සේරු කොට ඇත (*UN(DER) PAID IN THE PANDEMIC: An estimate of what the garment industry owes its workers,* 2020, p. 28). ඔවුන්ගේ තත්වය සාකච්ඡා කිරීමේදී ආර්ථික කරුණු වලින් ආරම්භ කිරීම වඩා යෝග්‍ය වන්නේ අනෙක් බොහෝ ප්‍රශ්න වල මූලාරම්භයද එහි වන බැවිනි.




*වසංගත සන්දර්භයෙහි අඩු ගෙවීම්: ඇඟලුම් කර්මාන්තය විසින් ස්වකීය සේවකයන්ට ඇති ණය ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවක් (2020, පිටුව 29).*

වසංගතය ආරම්භයේදීම වැටුප් කප්පාදු කිරීම්, අළුත් අවුරුදු හා වර්ෂ අවසාන සමුච්චිත දීමනා අහිමි වීම් මෙන්ම සමහර අවස්ථා වල රැකියා අහිමි වීම් වැනි තත්වයන් වලටද මුහුණ දීමටද සමහර ශ්‍රමිකයින්ට සිදුවිය (*Sri Lankan garment workers decry violations of labor rights - UCA News*, 2020; Hari Tv, 2020). මෙම කප්පාදු කිරීම් සිදුවන්නේ සාමාන්‍ය කාලයකදී වුවද ඔවුන්ගේ වැටුප අතිකාල දීමනාද ඇතුළුව රුපියල් 25,000 ක් පමණ වන පසුබිමක බව සිහිතබා ගත යුතුය (Hewamanne, 2021, p. 56). මේ පිළිබඳව මෑතදී එළි දක්වන ලද වාර්තාවකට අනුව 'COVID-19 Pandemic: A Pretext to Roll Back Sri Lankan Garment Workers' Rights' Report, 2020, p. 4) සමහර අවස්ථා වල ඇඟලුම් ශ්‍රමිකයන්ට ඔවුනගේ සාමාන්‍යය වැටුපෙන් දළ වශයෙන් 40% ක් පමණ අහිමි වී ගොස් ඇති බව පැහැදිලි වේ. මෙම තත්වය යටතේ වෘත්තීය සමිති, සේවාදායකයන් සහ

රජය අතර 2020 මැයි 5 වනදා ඇතිකර ගත් එකඟතාවක් මඟින් අරමුණු කළේ වසංගත තත්වය තුළ නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීමය. ඊට අනුව රැකියා අහිමි කිරීම් සිදු නොකිරීම, සේවයට වාර්තා කරන සහ නොකරන සියල්ලන්ගේ වැටුප් වලින් 50% ක් වත් ඔවුන් වෙත ලබාදීම (හෝ ඩොලර් 75 ක අවම වේතනයක් ලබාදීමට කටයුතු කිරීම) සහ නිත්‍ය සේවකයන්ගේ සමාජ ආරක්ෂණ අරමුදල් වලට සිය දායකත්වය දිගටම දැක්වීම වැනි කරුණු සම්බන්ධයෙන් එකඟතා ඇතිකර ගෙන තිබුණි (*COVID-19 Pandemic: A Pretext to Roll Back Sri Lankan Garment Workers' Rights,* 2020; *UN(DER) PAID IN THE PANDEMIC: An estimate of what the garment industry owes its workers,* 2020). එසේ වුවත් කම්කරු දෙපාර්තමේන්තුවේ විමර්ෂණ වලට අනුව නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගෙන් 32% ක් තරම් පිරිසකට වසංගත සමය තුළ සිය වැටුපවත් ලැබී නොතිබුණ අතර, එසේ සිදුවූ අහිමි වීම් වල සමස්තය මාසිකව රුපියල් මිලියන 88 ක් වැනි අති දැවැන්ත මුදලකි. මෙම පාඩුව රජයේ කිසිදු සහන වැඩසටහනකින් නොපියවූ බවද මතක තබාගත යුතුය (ඉහත එම). ඉහත රූප සටහනේ දැක්වෙන්නේ 2020 පෙබරවාරි සහ මාර්තු මාස අතර කාලය තුළ නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ වැටුප් පරතරයයි.

මේ සම්බන්ධ ක්‍රියාකාරියකු මෙම තත්වය යටතේ ශ්‍රමික ජීවිතයේ අත්දැකීම් පහත අන්දමට විස්තර කොට තිබුණි:

> ඇමතිතුමා කියූ නිසා රුපියල් 14,500 අවම වැටුප ලබා දුන්නත්, අළුත් අවුරුදු දීමනාව ඇතුළු සෙසු සියළු දීමනා කපා හැරියා. එම නිසා බොහෝ අයට සිය ණය තියා බෝඩිං ගාස්තු ගෙවා ගැනීමේ හැකියාවවත් තිබුණේ නැහැ. නිවෙස් වලට මුදල් යැවීමද බොහෝ දෙනා නතර කළා. සමහරුන්ට කියා තිබුණේ කණ්ඩායම් වශයෙන් සේවයට වාර්තා කරන ලෙසයි. නමුත් ඔවුන්ටත් ලබා දුන්නේ පළමු මාස දෙක තුළ අර්ධ වැටුපක් හා පසුව වැටුපෙන් කාලක්. අවසානයේ එයාලට අයින් කරන්න ඕන සේවකයන් අයින් කරලා දැම්මා. සමහර ශ්‍රමිකයන් වන්දි ඉල්ලා නඩු දමා ජය ගත්තත්, බොහෝ අය ඊට මැලි වූයේ කලාපයේ කිසිම තැනකින් අනාගතයේ තමන්ට වැඩ නොලැබේවිය යන බියෙන්.[1]

ප්‍රාග්ධන හිමියා මෙසේ වැටුප් කප්පාදු සහ රැකියා අහිමි කිරීම් ඔස්සේ සිය ලාභය දිගින් දිගටම වැඩිකර ගනිමින් සිටියදී (Hari Tv, 2020) රාජ්‍යය විසින්ද මෙම ආන්තික ප්‍රජාව සිය සුබසාධන යාන්ත්‍රණ වලින් බැහැර කොට තිබේ (Arunathilake, 2013). හදිසි අවස්ථා සහන දීමනාවක් ලෙස රජයෙන් ලබාදුන් රුපියල් 5000 දීමනාව නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ට

1 ක්‍රියාකාරියකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 28.

ලබාගත නොහැකි වීම තුළ මෙම තත්වය පැහැදිලිව දක්නට විය. ඊට හේතුව ලෙස දැක්වූයේ තමන් රැඳී සිටින ස්ථානයේ ස්ථිර පදිංචිය පෙන්වීමට ඔවුන්ට නොහැකි වීමය. මෙම ලිපිය ලිවීමේදී සම්මුඛ සාකච්ඡාවක් ලබාදුන් එක් ප්‍රතිචාරකයකුට අනුව “ගම් පළාතට ගිහින් එහෙ ලිපිනය පෙන්නලා රුපියල් 5000 ගන්න ඇඳිරි නීති පාස්පොතක් ලබාදුන්නේ නැහැ මට. කන්නවත් සල්ලි තිබුණෙ නෑ අන්තිමේ.”[2]




මූලාශ්‍රයඃ ආටිගල (2020)

ඒ අනුව වසංගත තත්වය තුළ මෙම ශ්‍රමිකයින්ගේ ආර්ථික තත්වය සම්බන්ධයෙන් රාජ්‍යය හෝ ප්‍රාග්ධන හිමිකරුවන් සංවේදී නොවූ බව පැහැදිලිය. එසේම ශ්‍රමිකයින් හා පුරවැසියන් ලෙස ඔවුන්ගේ අයිතීන් පිළිබඳව කිසිදු වගකීමක් නොගත් බවද පෙනී යයි. මේ නිසා ශ්‍රමිකයින්ගේ පෞද්ගලික ආර්ථික තත්වය තව තවත් සීඝ්‍රයෙන් නරක අතට හැරෙන්නට වූ අතර, එම නිසා ඔවුන් සිය ජීවිතය තුළ ආදායම මත පදනම්ව කලින් භුක්ති විඳි යම් හෝ තීරණ ගැනීමේ බලයක් තිබුණා නම් එයද නැතිව ගියේය (Hewamanne, 2021). ඒ අනුව කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ පවතින ආර්ථික ආන්තීකරණය තවදුරටත් තියුණු වූ බව කිව හැකිය.

2 බියගම නිදහස් වෙළඳ කලාපයේ ශ්‍රමිකයකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 31.

## කොවිඩ්-19 යටතේ ජීවන තත්වයේ පහළ බැසීම

කොවිඩ්-19 වසංගතයේ බලපෑම විවිධ කණ්ඩායම් වලට විවිධ අයුරින් දැනුනු බව දැන් වනවිට හොඳින් පැහැදිලි කරුණකි. මේ සම්බන්ධයෙන් හොඳම උදාහරණයක් වන්නේ නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයාය. වසංගතයට පෙර සිටම අත්විඳින ලද්දා වූ බහුවිධ ආන්තිකරණයන් නිසා මෙවැනි අර්බුද තත්වයක් තුළ වඩාත් අවධානමට ලක්විය හැකි සහ වින්දිත මට්ටමකට ඔවුන් ඇද වැටුණි. එහිදී ශ්‍රමිකයන් මෙන්ම පුරවැසියන් ලෙසත් අයිතිවාසිකම් උල්ලංඝණය වීම් ගණනාවකට ඔවුන් මුහුණ පාන්නේ ඒ අනුවය. මෙම කොටසේදී මගේ අරමුණ මෙසේ අයිතීන් උල්ලංඝණය වීම හරහා ශ්‍රමිකයන් ලෙස හා පුද්ගලයන් ලෙස ඔවුන්ගේ ජීවන තත්වයේ සිදුවූ පහත බැසීම හඳුනා ගැනීමයි.

### *සේවා ස්ථානයේ තත්වය*

කොවිඩ් පළමු රැල්ලේ සිට දෙවන රැල්ල වන විට නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ ජීවන තත්වයෙහි දරුණු පසුබැස්මක් සිදුවූයේ බොහෝ කොටම පෞද්ගලික ආර්ථිකයේ කඩාවැටීම නිසාය. වර්ෂ 2020 ඔක්තෝබර් මාසයේ 'බ්‍රැන්ඩික්ස් පොකුර' අරබයා උද්ගත වූ තත්වය හේතුවෙන් මේ තත්වය තවත් නරක අතට හැරුණි. පහත උපුටා දක්වා ඇත්තේ එම ආයතනයෙහි සේවය කළ අයෙක් ලබාදුන් විස්තරයක් වේ:

> මම දැනට මාතර කුඹුරුගමුව රෝහලේ කොරෝනා රෝගය සඳහා ප්‍රතිකාර ගන්නවා. අපේ ආයතනයේ වැඩ කළ 200 ක් පමණ පිරිස මේ අවස්ථාවේ මෙසේ ප්‍රතිකාර ලබා ගන්නවා. මුලින්ම ආයතනයේ 600 ක් පමණ දෙනාට වෛරසය වැළඳී ඇති බව තහවුරු වූ අවස්ථාවේ අපට කීවේ ඉලක්ක සම්පූර්ණ කරගැනීම සඳහා දිගටම වැඩ කරගෙන යන ලෙසයි. ඒ වෙලාවේ යමක් කළා නම් මේක නවත්තගන්න තිබුණා. අපට මුලින්ම කීවේ ආයතනයට ඇවිත් පරීක්ෂා කරගන්නා ලෙසයි. එහිදී තමයි මට රෝගය ආසාදනය වී ඇති බව හෙළි වුනේ. ඒත් සමඟම මගේ පවුලේ අයට නිරෝධායනය වන ලෙස දන්වා ඔවුන්ට අවශ්‍ය ආහාර පානාදිය ආයතනයෙන් ලබාදුන්නා. ඔවුන්ගේ PCR පරීක්ෂණ හෙට කිරීමට නියමිතයි. අපේ පරීක්ෂණ ප්‍රතිඵල එනවිට අපි Victoria's Secret වෙළඳ නාමයේ ඇඟළුම් වගයක් මසමින් හිටියේ. කතාවක් තියෙනවා ඊට අවශ්‍ය ද්‍රව්‍ය ගෙනාවේ ඉන්දියාවෙන් කියලා. එහි ඇත්ත නැත්ත මම දන්නේ නැහැ. (*Garment workers on the frontline of the pandemic outbreak in Sri Lanka,* 2020)




මූලාශ්‍රය: ආටිගල (2020)

වෛරසය වැළඳී තිබියදී දීර්ඝ වැඩ පැය ගණනක් සේවය කිරීමට සිදුවීම කොතරම් අපහසු හා කළමණාකාරීත්වය පාර්ශවයෙන් කොතරම් අමානුෂිකදැයි යන්න අමුතුවෙන් සඳහන් කිරීම අවශ්‍ය නොවේ. සමහර අවස්ථා වල දිගටම වැඩ කළ හැකි අයට එසේ කළ නොහැකි අයගේද ඉලක්ක සම්පූර්ණ කිරීම සඳහා කිසිදු අමතර ගෙවීමකින් තොරව වැඩිපුර වැඩ කිරීමට සිදුවූ බවද වාර්තා වුනි.[3]

මෙයාකාරයෙන් දැඩි ලෙස සූරාකෑමෙන් පසුවත්, වෛරසය නොවැළඳුනු අයව එන්නත්කරණය කිරීමට හෝ කර්මාන්තශාලාව තුළ දීර්ඝ සේවා මුර සම්පූර්ණ කරන්නන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව තහවුරු කිරීමට කිසිදු වැඩ පිළිවෙළක් අනුගමනය කොට නොතිබීම නින්දා සහගතය (Hari Tv, 2020; Ruwanpura, Gunawardena, and Padmasiri, 2021). හේවාමාන්න (2021 p. 65) සඳහන් කොට ඇත්තේ බ්‍රැන්ඩික්ස් පොකුරෙන් බාහිර සමාජයට එල්ල කළ තර්ජනය නොවන්නට මෙම භාවිතයන් දිගින් දිටම පැවතෙන්නට හොඳටම ඉඩ තිබූ බවයි.

## ***පෞද්ගලික ජීවිතය***

සමාජ සහ ප්‍රසිද්ධ මාධ්‍ය වල පලවූ බොහෝ ප්‍රවෘත්ති වලින්, නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ට රට අගුළු ලා තිබූ කාල සීමාව තුළ ජීවිතය කොතරම් අභියෝගාත්මක වුණිද යන්න පැහැදිලි විය. සිය කුලී නිවාස තුළ

3 නිදහස් වෙළඳ කලාපයක ශ්‍රමිකයකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 28.

ඔවුන් පත්වූ අනාරක්ෂිත තත්වය ඒ අතර වැදගත් වේ. ප්‍රමාණවත් තරම් ආහාර පානාදිය නොතිබීම, සහකරුවන්ගේ ශාරීරික අඩන්තේට්ටම් සහ හිංසනයට ලක්වීම සහ නිවෙස් හිමියන්ගෙන් අනවශ්‍ය ලිංගික අවධානය ලැබීම වැනි ගැටළු මේ අතර විය. මීට අමතරව තිබූ මූලිකම ප්‍රශ්නයක් වූයේ මෙවැනි කුලී නිවාස වල කාමරයක තුන් හතර දෙනෙකු එක්ව වාසය කිරීම වෛරසය පැතිරීමට සුවිශේෂයෙන් තුඩදුන් කාරණයක් වීමයි (Perera and Fenando, 2020). බියගම නිදහස් වෙළඳ කලාපයේ සේවක අයිතීන් පිළිබඳ ක්‍රියාකාරියෙක්ට අනුව තත්වය පහත පරිදි විය:


> පොසිටිව් වෙන අයට වැඩට එන්න එපා කියනවා. ඔවුන් දවස් 14 ක් නිවසේ නිරෝධායනය විය යුතුයි. නාන කාමරය පාවිච්චි කිරීමට ගියාම බෝඩිං අයිතිකරුවන් බලන්නේ හරියට යකෙක් දිහා බලනවා වගේ. ඔවුන්ට කන්න දෙයක් තිබුණේ නෑ. අඩු තරමේ විටමින් සී පෙත්තක් තරම්වත් තිබුණෙ නැහැ බොහෝ අයට. PHI ලා ආවෙවත් නෑ. ටික කාලයක් ගියාම සමහර බෝඩිං අයිතිකරුවන් නේවාසිකයින්ට පිට වෙන්න කියා තිබුණා, මොකද බොහෝ දෙනා එකම තැන නිරෝධායනය වන විට වැසිකිළි එහෙම හිර වෙන්නටත් කරන්ට් බිල් වැඩි වෙන්නටත් පටන්ගත් නිසා. ඒ වගේම සමහර අයට දින 30 ක් පමණ දක්වා නිරෝධායනය වෙන්නට සිදුවුනා. ඊට හේතුව එක් නිරෝධානයක් ඉවර වෙද්දි එතැනම තවත් අයෙක් පොසිටිව් වීම. ඇත්තෙන්ම සමහර අවස්ථා වල දිගින් දිගටම නිරෝධායනයේ හිටපු අයත් උන්නා.[4]

සංචරණ සීමා සහ අඩුවන ආදායම නිසා බොහෝ ශ්‍රමිකයින්ට දැඩි ආහාර අර්බුදයක්ද පැවතුණි. බොහෝ දෙනා දිනකට එක් වේලකින් පමණක් සෑහීමට පත්ව සිට ඇති අතර, කහට තේකකින් සහ ගස් වලින් වැටෙන පලතුරු අනුභව කරමින් ජීවිතය ගැටගසා ගත් අය පිළිබඳ පුවත්ද අසන්නට ලැබුණි. කඩයකින් බඩු මිළදී ගත්තේ නම් ඒ ණයටය. සන්ධ්‍යාවේ 6 ට ඇඳිරි නීතිය බලාත්මක කරන ලද බොහෝ දිනවල පස්වරු 2 තරම් වනතෙක් වැඩ කරන්නට සිදුවූ බොහෝ දෙනෙක් වූ අතර, එම නිසා ඇඳිරි නීතියට පෙර නිවසට යාගන්නට තරම් ඔවුන්ට කාලය ප්‍රමාණවත් නොවුණු බව පැවසේ (ඉහත එම; Wijesinghe, 2020).

මෙම සියළු අත්දැකීම් වලින් කියවෙන්නා වූ සූරාකෑම පිළිබඳ ආඛ්‍යානයෙන් පැහැදිලි වන්නේ රාජ්‍යයේද ආශිර්වාදය සහිතව සිදුවන ප්‍රාග්ධනය රැස් කිරීමේ පීඩාකාරී ක්‍රියාවලිය තුළ ශ්‍රමිකයා කොතරම් ආන්තීකරණය වන්නේද යන්නය. නිරෝධායනය වෙමින් සිටි හෝ වසංගත තත්වය තුළත් දිගටම රැකියාවෙහි නියුතු වූ නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ තත්වය සොයාබැලීමට කරදර නොවීමෙන් හා, කර්මාන්ත ශාලා

4 ක්‍රියාකාරියකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 28.

වල අමු අමුවේ සිදුවූ කොවිඩ් රෙගුලාසි උල්ලංඝණය කිරීම් නොදැක්කා සේ සිටීමෙන්, මෙම ප්‍රාග්ධන රැස් කිරීමේ ක්‍රියාවලියට රාජ්‍යය කුමන පරිමාණයකින් සම්බන්ධ වන්නේද යන්න පැහැදිලි වේ. එතුළ එම ප්‍රාග්ධන සම්පාදන ක්‍රියාවලියට පණ පොවන ශ්‍රමිකයාගේ සෞඛ්‍යය, ආරක්ෂාව සහ ගරුත්වය යන සියල්ල නොසළකා හැර ඇත.




මූලාශ්‍රයඃ බණ්ඩාර (2021ඉ)

***සමාජ දූර්මත***

නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින් වෛරසය පැතිරවීමට විශේෂ ප්‍රවණතාවයක් සහිත බව වන වටහා ගැනීම පිටුපස පෙර දක්වන ලද කිලිටි භාවය සහ අසංවර බව පිළිබඳ ආඛ්‍යානය පවතී (Preston and Firth, 2020, as cited in Hewamanne, 2021). බ්‍රැන්ඩික්ස් පොකුර ආශ්‍රිතව මෙම තත්වය සුවිශේෂයෙන් දක්නට ලැබුණු අතර, ඊට සමකාලීනව හට ගැනුණු පෑලියගො ඩ මත්ස්‍ය වෙළඳපොළ ආශ්‍රිත පොකුරට මෙම ඉරණම අත්නොවීම සැළකිය යුත්තකි. සමාජ හා ප්‍රසිද්ධ මාධ්‍ය වලින් පෑලියගොඩ පොකුරට ලබා නොදුන් ප්‍රචාරයක් බ්‍රැන්ඩික්ස් පොකුරට ලබාදීම මඟින් වෛරසයේ නව ප්‍රභවය ලෙස ඔවුන් උලුප්පා දක්වන ලදී. පුරුෂාධිපති පද්ධතියක් තුළ සදාචාර සම්පන්න භාවය පිළිබඳ පනවා ඇති නියමයන්ට පිටතින් ජීවත් වන කාන්තාව විවිධාකාරයේ හානීන්ට නිරාවරණය වියහැකි බවට වන මතය තුළ මෙම ආඛ්‍යාන අරුත් ගනී. එම කතිකා මඟින් ඇති කරන ලද පීඩනය පිළිබඳව ක්‍රියාකාරීනියක් මෙසේ විස්තර කළාය:

> මෙම කාන්තාවන් බොහෝ දෙනෙක්ට සිය ගම්බිම් බලා යෑමට නොහැකි වුනා. ඊට හේතුව ඔවුන්ගේ අසල්වැසියන් 119 අමතා ඔවුන් පැමිණි බව වාර්තා කිරීම. මා දන්නා එක් අවස්ථාවක එක් කාන්තා ශ්‍රමිකයෙක් පොළොන්නරුවටම ගිහින් දුම්රිය වේදිකාව ළඟට පැමිණ සිටි අම්මා මොහොතකට දැකගෙන අනෙක් අතට කොළඹට පැමිණියා. ගාමන්ට් ළමයි

වෛරසය ගමට ගෙන ඒවි යැයි ගම්වාසීන් තුළ තිබූ භීතිය නිසයි ඇයට ගෙදර යාමට නොහැකි වූයේ. ඒ අවස්ථාවේ ඔවුන්ට උදා වුනේ වැඩට යන්නත්, බෝඩිමේ ඉන්නත්, ඒ වගේම ගෙදර යන්නත් බැරි තත්වයක්.[5]

රාජ්‍යය මෙන්ම සමාජයද සංක්‍රමණික ශ්‍රමිකයා සළකන්නේ නගරයේ ජීවත් වන පිටස්තරයකු ලෙසය. එම නිසා එම අවකාශයෙහි ඔවුන්ගේ පැවැත්ම පොදුජන විඥානය තුළ එතරම් මුල්බැස ගෙන නොමැති අතර, ඔවුන්ගේ අයිතීන් දරුණු ලෙස උල්ලංඝණය වීම පිළිබඳ විවේචනයක් නොපැවතීමට එයද එක් හේතුවක් වී ඇත. එමෙන්ම රාජ්‍යයේ පරිපාලන ව්‍යුහය තුළත් ඔවුන්ගේ පැවැත්ම අදෘශ්‍යමාන වී තිබේ. මන්ද ඔවුන් නිල වශයෙන් පදිංචිව සිටිය යුතු ස්ථානයේ ඔවුන් භෞතිකව නොමැති වීමත්, භෞතිකව වාසය කරන ස්ථානයේ නිල වශයෙන් පදිංචිව නොසිටීමත් නිසාය. අත්තන්පොලට (2006) අනුව මෙම 'අස්ථානික භාවය' හේතුවෙන් කරදරේ නොවැටී සිටීමට ප්‍රමාණවත් මානසිකත්වයක් ශ්‍රමිකයා තුළ වර්ධනය වී ඇත. මෙම මානසිකත්වය අභ්‍යන්තරීකරණය වූ විට සූරාකෑම සාමාන්‍යකරණය වේ; සාමාන්‍යකරණය වූ විට එය බාහිර ලෝකයට මෙන්ම ඔවුන්ටත් අදෘෂ්‍යමාන වේ; එවිට එම පද්ධතිය හා එහි ව්‍යුහයන් පිළිබඳව ප්‍රශ්න නැඟීමේ හැකියාව නැතිව යයි.

ස්ත්‍රීත්වය, ආර්ථික පසුබිම මෙන්ම රැකියාව නිසාද ඔවුහු බහුවිධ ආන්තීකරණයන්ට ලක්වෙති. එම නිසා තත්වය නිවැරදි කිරීම සඳහා ක්‍රියාත්මක වීමට ඇති ඉඩ තවදුරටත් ඇහිරෙන අතර (Jordal, Öhman, and Wijewardene, 2020), අනතුරට ලක්විය හැකි භාවය ඊට සාපේක්ෂව ඉහළ යයි. බියගම නිදහස් වෙළඳ කලාපයේ සේවයේ නියුතු ප්‍රතිචාරකයකු වසංගත සමය තුළ මුහුණ දුන් පහත අත්දැකීමෙන් මෙම තත්වය පැහැදිලි වේ. ඇයට අනුව නැවත සිය නිවස බලා යාම සඳහා ඇඳිරි නීති සංචරණ අවසරපතක් ලබාගැනීමට ගියවිට අදාළ පොලිස් නිලධාරියා හඟවා ඇත්තේ එදින රාජකාරී අවසන් වූ විට ඇයව පෞද්ගලිකවම රැගෙන යන්නම් කියාය[6]. මෙහි වෙනත් අරමුණක් තිබූ බව ඉතා පැහැදිලි වේ. තවත් අවස්ථාවකදී කිසිදු ගරුත්වයකින් තොරව බස් රථ වලට පටවාගෙන මෙම ශ්‍රමිකයන් සිය දිස්ත්‍රික්කයන් බලා ගෙනගොස් තිබුණි. එහිදීද අදාළ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයට ඔවුන් ඇරලවා තිබුණා මිස එතැනින් එහාට නිවෙස් බලා යන ආකාරයක් සම්පාදනය කොට දී තිබුණේ නැත. රට පුරා ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන අවස්ථාවක දින ගණනාවක් සිය තාවකාලික නවාතැන් වල කුසගින්නේ පසුවූ මෙම පිරිස ගෙදර යාමට මාර්ගයක් සැලසීමකින් තොරව

5 ක්‍රියාකාරියකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 28.

6 බියගම නිදහස් වෙළඳ කලාපයේ ශ්‍රමිකයකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 මැයි 31.

නගරයන් මැද හුදෙකලා කොට යාම නිසා පා ගමනින් නිවස දක්වා යාමට සිදුවූ අතර, සමහරුන්ට සිය නිවසට යාමට දින දෙකක් තරම් කාලයක් ගතවූ අවස්ථා තිබුණි[7].


මෙම තත්වය තුළ විද්‍යාමාන වන 'හඬක් නොමැති බව' යනු ආයතනගත වී ඇති යථාර්ථයකි. නිදසුනක් ලෙස කිසිදු දැනුම් දීමක් නොමැතිව හමුදාව විසින් මෙම ශ්‍රමිකයින් නිරෝධායන මධ්‍යස්ථාන වලට කුදලාගෙන යාම දැක්විය හැකිය. මෙවැනි සමහර අවස්ථා වලදී කොවිඩ් නොමැති බවට වෛද්‍යමය සාක්ෂි පවතිද්දී පවා බලෙන්ම මෙසේ නිරෝධායනය සඳහා යොමුකර තිබුණේ පැහැදිලි කිරීමට කිසිදු අවස්ථාවක් ලබා නොදීය (De Silva, 2020). රාජ්‍යය ව්‍යුහය මඟින්ද මෙම ශ්‍රමිකයින් ගෞරවයක් සහිතව සැළකීමට තරම් නොවන බව තීරණය කර ඇති බවය මින් පෙනී යන්නේ.

නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්ගේ හඬක් නොමැති බව විශේෂයෙන්ම වසංගත තත්වය තුළදී අයිතිවාසිකම් උල්ලංඝණය වීම් ගණනාවකට තුඩු දී ඇත. ඉහත දැක්වූ පරිදි මේ පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් පැවැත්ම තුළ සිදුව ඇත්තේ එම තත්වය සාමාන්‍යකරණය වීමත්, ඒ හරහා අදෘෂ්‍යමාන වීමත්ය. වසංගතයෙන් මතු කරන ලද අමතර අභියෝග පිළිබඳ යථාර්ථය තුළ මෙම ආන්තීකරණය වඩාත් දරුණුව ඇත්තේ ඔවුන්ගේ සමාජ-ආර්ථික ආරක්ෂාව එන්න එන්නටම පිරිහෙමින් පවතින හෙයිනි. එහෙත් ශ්‍රම බලකායක් වශයෙන් අද වන විට ඛණ්ඩනය වී ඇති නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින් අතර එම නිසා මේ තත්වයට ප්‍රතිරෝධය දැක්වීමට අවශ්‍ය හැකියාව වර්ධනය වී නැත. මෙසේ ශ්‍රමය ඛණ්ඩනය කිරීම ප්‍රාග්ධනය එක්රැස් කිරීම සඳහා උපකාරී වන බව නොකිවමනාය. ස්වකීය අයිතීන් භුක්ති විඳීමෙහිලා ඔවුන්ට එම තත්වය බලපෑම් කරන ආකාරය ඊළඟ කොටසින් විමසා බලන්නෙමි.

## රාජ්‍යය, ප්‍රාග්ධනය සහ ශ්‍රමය

වසංගතයේදී නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයා මුහුණ දුන් තත්වය තුළ ශ්‍රමය අරබයා රාජ්‍යය සහ ප්‍රාග්ධනයෙහි ක්‍රියාකාරීත්වය යම්තාක් දුරකට හෝ හඳුනාගත හැකි වේ. එහිදී ශ්‍රමිකයා මුහුණ දුන් අමිහිරි අත්දැකීම් වලින් රාජ්‍යය හා ප්‍රාග්ධනය ඉවත බලාගත් බව දැන් වනවිට පැහැදිලිය. නමුත් එතරම් පැහැදිලි නොවන යථාර්ථයක් වන්නේ මෙම ඉවත බැලීම තුළ ශ්‍රමිකයා අත්‍යන්ත ලෙස සූරාකෑමට අවශ්‍ය තත්වය නිර්මාණය වූයේ කෙසේද යන්නයි.

7 රාජ්‍ය නොවන සංවිධානයක සාමාජිකයකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 ජූනි 20.




මූලාශ්‍රයː බණ්ඩාර (2021ඉ)

මුලින්ම ප්‍රාග්ධනයට අදාළ කරුණු සළකා බලමු. මෙහිදී ප්‍රාග්ධනය නියෝජනය වන්නේ කර්මාන්ත ශාලා හිමියන් සහ එහි කළමණාකාරීත්වයෙනි. වසංගතය නිසා නිදහස් වෙළඳ කලාප තුළ සිරවූ ශ්‍රමිකයන්ට වෛරසය පතුරුවන්නන් ලෙස සමාජයේ තිබූ තත්වය හේතුවෙන් සිය කුලී නිවාස වලින් පිටතට යාගත නොහැකි වීමේ අසරණකමින් මෙම ප්‍රාග්ධන හිමිකරුවෝ ප්‍රයෝජන ගත්හ. එහිදී නිෂ්පාදන වියදම් අඩු කිරීම තුළින් ලාභය වැඩිකර ගැනීම අරමුණු කරන ලදී. එය මූලිකවම සිදුකරන ලද්දේ ශ්‍රමිකයන්ට සිය නවාතැන් වල සිට කර්මාන්ත ශාලාවට යාම් ඊමේ පහසුකම් කළමණාකාරීත්වය විසින් සපයා, දෛනික වැඩ පැය ගණන දීර්ඝ කිරීම තුළිනි. ඉන්පසු නිත්‍ය සේවකයන්ගේ සමාජ ආරක්ෂණ පිරිවැය අඩු කරන ලද්දේ ඇඟළුම් නිෂ්පාදන වලට ඇති ඉල්ලුම පහත යාමේ පදනම මතය. තෙවැනි ක්‍රමයක් වූයේ වෛරසය ආසාදනය වූවන්ගේ වැඩද ආසාදනය නොවූ අය ලවා කිසිදු අතිකාල දීමනා හෝ අමතර ගෙවීම් ලබාදීමකින් තොරව කරවා ගැනීමයි[8]. කෙසේ නමුත්, මෙසේ ඉතා පීඩාකාරී තත්වයන් යටතේ ශ්‍රමිකයන්ගෙන් වැඩ ගැනීමට තරම් ඇඟළුම් නිෂ්පාදන වලට ඉල්ලුමක් තිබුණා විය යුතුය. ඇත්තෙන්ම ලංකාවේ ඇඟළුම් කර්මාන්තයට මෙම වකවානුව තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය මුහුණු හා අත් වැසුම් වැනි නිෂ්පාදන ලබාදීම සඳහා දැවැන්ත ඇණවුම් ලැබුණු බවට තොරතුරු තිබේ (*Sri Lanka's apparel industry attracts over 500 mln USD orders for PPE,* 2020). එසේම බදු සහනයේ ප්‍රතිලාභද ශ්‍රමිකයාගේ මට්ටමට ළඟා වී නොතිබීම විශේෂයෙන්ම මෙවැනි අර්බුද අවස්ථාවක කණගාටුදායකය (Hari Tv, 2020).

8 රාජ්‍ය නොවන සංවිධානයක සාමාජිකයකු සමඟ සම්මුඛ සාකච්ඡාව (විද්‍යුත් ක්‍රම ඔස්සේ), 2021 ජූනි 20.

මෙහිදී ශ්‍රමිකයා ලබන සැළකුම් තුළ ඔවුන්ගේ මානව වටිනාකම සහ ගරුත්වය හෑල්ලුවට ලක්වන අයුරු පැහැදිලිව පෙනී යයි. අදාළ අවම වේතනය ඔවුන්ට ගෙවා දැමීම ප්‍රමාණවත් සේ පෙනී යන්නේ මෙවැනි චින්තනයක් තුළය. මානවයා වෙළඳ භාණ්ඩයක තත්වයට ලඝු වී ප්‍රාග්ධනයේ රැස්කිරීම සහ ව්‍යාප්තිය වෙනුවෙන් යෙදවෙන්නේ ඒ අනුවය. මෙම තත්වය රාජ්‍යයේද වාසියට හේතු වන අයුරු ඊළඟට මගේ අවධානයට යොමු වේ.

හැන්කොක් (2006) පෙන්වා දී ඇති පරිදි අසාධ්‍ය තත්වයේ පසුවන රටේ ආර්ථිකයට කාන්තා ශ්‍රමය ප්‍රධාන ආදායම් මාර්ගයකි. එම ශ්‍රමය වඩ වඩාත් සූරාකෑම මඟින් ප්‍රාග්ධන හිමිකරුවන්ගේ ලාභයද වැඩිවේ. ප්‍රාග්ධන හිමිකරුවන් ගෙවන්නා වූ බදු මුදල් මත යැපෙන රාජ්‍යයටද එම නිසා එකී සූරාකෑම වාසිදායකය. හාවි (2007) සහ බොදියු (1998) විසින්ද මීට සමාන අදහස් දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ ආදායම් මර්ග සොයමින් සිටින සහ සීඝ්‍රයෙන් නව ලිබරල්කරණය වන රාජ්‍යයට මෙවැනි අවිධිමත් ශ්‍රම බලකායක පැවැත්ම සහ එහි අත්‍යන්ත සූරාකෑම වැදගත් වන බවයි. එම නිසා ඒ ශ්‍රමය නියාමනය කිරීමේ ක්‍රියාවලියට රාජ්‍යය සම්බන්ධ වන අතර, එය සිදුවන්නේ එක්කෝ නොදැක්කා සේ සිටීමෙනි; නැතිනම් ඊට ක්‍රියාශීලීව දායක වීමෙනි.

මෙම නොදැක්කා සේ සිටීමේ භාවිතය සම්බන්ධයෙන් ලංකා රාජ්‍යය - මෙන්ම බොහෝ සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් - ප්‍රසිද්ධියක් උසුලයි. රටේ සමස්ත ශ්‍රම බලකායට එක සේ අදාළ වියයුතු කම්කරු නීතියක් පවතිද්දීත් නිදහස් වෙළඳ කලාප තුළ එම නීතිය ප්‍රායෝගිකව බල නොපැවැත්වීම ඊට හොඳ නිදසුනකි. සාධාරණීකරණය කළ නොහැකි තරම් දීර්ඝ වැඩමුර, ප්‍රමාණවත් නොවන විවේක කාලය සහ අනාරක්ෂිත සේවා ස්ථාන තත්වයන් මෙම ගැටළුවෙහි සමහරක් පැතිමාන පමණක් වේ. රාජ්‍යයේ නිලධාරීන්, කර්මාන්ත ශාලා හිමිකරුවන් මෙන්ම ශ්‍රමිකයන් පෞද්ගලිකවද මෙම තත්වය සාමාන්‍ය එකක් ලෙස පිළිගෙන ඇත (Skanthakumar, 2017). වසංගත තත්වය තුළ රාජ්‍යයේ මෙම භූමිකාව ප්‍රකට වූයේ ඇඳිරි නීති සංචරණ බලපත්‍ර ලබාදීම ප්‍රතික්ෂේප කිරීම, ඇඳිරි නීති තත්වයක් තුළ නිවසට යාමට ප්‍රතිපාදන සැලසීමකින් තොරව නගරවල් මධ්‍යයේ හුදෙකලා කොට දමා යාම, සහ රජයේ සහනාධාර ක්‍රම වලට සුදුසුකම් ලබා නොදීම වැනි අවස්ථා තුළිනි. ප්‍රාග්ධනය සහ රාජ්‍යය යන ද්විත්වය සම්බන්ධයෙන්ම දැකගත හැකි තත්වයක් වන්නේ ශ්‍රමිකයා දරුණු ලෙස සූරාකෑමට ලක්කොට එම ලාභ ලබාගැනීමට භාවිතා කරන ශරීරය ඉවත දැමීමකි (Hewamanne, 2021). එම නිසා රාජ්‍යය සහ ප්‍රාග්ධනයෙහි අන්තර් රඳා පැවැත්ම නිදහස් වෙළඳ කලාප තුළ ශ්‍රමය දිගින් දිගටම සූරාකෑමට ලක්වීම කෙරෙහි ඍජුව දායක වී ඇත.

## නිගමනය

මෙම පරිච්ඡේදය තුළ මගේ අරමුණ වූයේ කොවිඩ්-19 වසංගතය මඟින් නිදහස් වෙළඳ කලාප වල ශ්‍රමිකයින්ගේ ජීවිත බලපෑමට ලක්කළ අයුරු හඳුනා ගැනීමයි. එහිදී ඔවුන්ගේ පවතින ආන්තික තත්වය වැඩි වර්ධනය කිරීමටත්, ඔවුන් තවදුරටත් සූරාකෑමට ලක් කිරීමටත් රජයේ වසංගත ප්‍රතිචාරය හේතු වූ අයුරු විමසුමට භාජනය කළෙමි.

සාමාන්‍ය තත්වයන් යටතේ වුවද නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින් පන්තිය, ස්ත්‍රී-පුරුෂ භාවය සහ වෙනත් සමාජ-සංස්කෘතික සාධක වල එකතුව නිසා දරුණු ලෙස ආන්තීකරණය වූ පිරිසකි. කොවිඩ්-19 වසංගතය මඟින් එය තවත් දරුණු අතට හරවන ලදී. වසංගතයේ එක් එක් රැල්ලත් සමඟ මෙම ශ්‍රමිකයින්ගේ පෞද්ගලික ආර්ථිකය වඩ වඩාත් පිරිහීමට ලක්වූ අතර, ඊට අනුව ජීවන රටාවේද දැඩි පසුබෑස්මක් දක්නට විය. එම තත්වය තුළ ඔවුන් මුහුණ දෙන සූරාකෑම වඩ වඩාත් දරුණු වූවත්, ඒත් සමඟම එය වඩ වඩාත් සාමාන්‍යකරණය වීම හා ඒ තුළින් අදෘෂ්‍යමාන වීම සිදුවිය.

නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින් පිළිබඳ සමාජයේ කලින් සිටම පැවති දුර්මතද වසංගත තත්වය තුළදී වඩාත් තීව්‍ර වන්නට විය. ඒ අනුව ඔවුන් සිය රැකියා සහ ජීවන ක්‍රමය නිසා වෛරසය පැතිරවීමට සාපේක්ෂව වැඩිපුර ඉඩක් ඇත්තවුන් බවට වන මතයක් සමාජගත වුනි. අදාළ ශ්‍රමිකයින්ද දැන් වන විට මෙවැනි ආකල්ප වලට හොඳින් හුරු වී සිටිති. නව ලිබරල්වාදයේ බණ්ඩනය කරන සුළු බලපෑම මෙම තත්වය වැඩිදුරටත් උත්සන්න කොට ඇත්තේ එදිනෙදාට ජීවිතය පවත්වාගෙන යෑම පිළිබඳ මානසිකත්වයක් ජනිත කරමිනි. එම නිසා සංවිධිත ප්‍රතිරෝධය පිළිබඳ හැඟීමක් හෝ ඔවුන් තුළ වර්ධනය නොවන බව පැවසීම වරදක් නොවේ.

මෙම තත්වයට රාජ්‍යය සහ ප්‍රාග්ධනය යන දෙකම වගකිව යුතුය. නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයා පාරිභෝජන භාණ්ඩයක තත්වයට ලඝු කිරීමත්, අවම වේතනය ගෙවා දැමීමෙන් පහසුවෙන් කළමණාකරණය කළ හැකි බවට සිතීමත් නිසා ඔවුන්ගේ මානව වටිනාකම සහ ගරුත්වය සම්පූර්ණයෙන්ම නැතිකර දමා තිබේ. එමඟින් සිදුව ඇත්තේ ශ්‍රමිකයා උපයා දෙන ලාභය සහ ඊට අදාළ ශ්‍රමය අතිශය අසාධාරණ ලෙස භාවිතා කොට, එම ලාභය උත්පාදනය සඳහා යොදාගන්නා ශරීරය අමතක කොට දැමීමයි. රාජ්‍යයට මෙම ශ්‍රමය යනු ආදායම් උපයන මාර්ගයකි; ප්‍රාග්ධනයට එය තවදුරටත් රැස් කිරීම සහ ව්‍යාප්ත වීමට අවශ්‍ය කරන්නා වූ මෙවලමකි. එම නිසා එම ද්විත්වයටම ශ්‍රමිකයා සූරාකෑමට හේතු ඇතිවාක් මෙන්ම, එම සූරාකෑම දිගටම හා වඩාත් නිර්දය ලෙස පවත්වාගෙන යාමට වසංගත තත්වය තුළින් ඉඩ හසර පාදා දී ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ

Artigala, A. (2020) *Facebook*. Available at: https://www.facebook.com/permalink.php?story_fbid=4562515707099223&id=580456651971835 (Accessed: 24 July 2021).

Arunatilake, N. (2013) 'Precarious Work in Sri Lanka', *American Behavioral Scientist*, 57(4), pp. 488–506. doi: 10.1177/0002764212466246.

Attanapola, C. T. (2006) 'Were they ever "in place"? Sense of place and self-identities among migrant female export-processing zone workers in Sri lanka', *Norsk Geografisk Tidsskrift - Norwegian Journal of Geography*, 60(3), pp. 217–226. doi: 10.1080/00291950600891778.

Bandara, S. (2021a) *Facebook*. Available at: https://www.facebook.com/ArtOfSajith/photos/a.281558598710607/1829869590546159/?type=3 (Accessed: 24 July 2021).

Bandara, S. (2021b) *Facebook*. Available at: https://www.facebook.com/ArtOfSajith/photos/a.281558598710607/1839013799631738/?type=3 (Accessed: 24 July 2021).

Bandara, S. (2021c) *Facebook*. Available at: https://www.facebook.com/ArtOfSajith/photos/a.281558598710607/1873961409470310/?type=3 (Accessed: 24 July 2021).

Bourdieu, P. (1998) *Acts of Resistance: Against the New Myths of Our Time*. Translated by R. Nice. Cambridge: Polity Press.

*COVID-19 Pandemic: A Pretext to Roll Back Sri Lankan Garment Workers' Rights* (2020) AFL-CIO, Clean Clothes Campaign, Labour Behind the Label, Workers United, Maquila Solidarity Network, War on Want and USAS. Available at: https://cleanclothes.org/file-repository/sri_lanka_brief_ march_2021.pdf.

De Silva, M. (2020) 'Situation Of Garment Factory Workers In Katunayake – Covid-19', *Colombo Telegraph*, 14 October. Available at: https://www.colombotelegraph.com/index. php/situation-of-garment-factory-workers-in-katunayakecovid-19/ (Accessed: 24 July 2021).

*Garment workers on the frontline of the pandemic outbreak in Sri Lanka* (2020) WARONWANT. Available at: https://waronwant. org/news-analysis/garment-workers-frontline-pandemicoutbreak-sri-lanka

(Accessed 20 June 2021).

Gunatilaka, H. (2019) 'Gender Inequality at Work: A Literature Review', *International Journal of Research and Innovation in Social Science (IJRISS)*, 3(IX). Available at: https:// www.rsisinternational.org/virtual-library/papers/genderinequality-at-work-a-literature-review/ (Accessed: 24 July 2021).

Hancock, P. (2006) 'Women, work and empowerment: A portrait of women workers in two of Sri Lanka's Export Processing Zones', *Norsk Geografisk Tidsskrift - Norwegian Journal of Geography*, 60(3), pp. 227–239. doi: 10.1080/00291950600891836.

Hancock, P., Carastathis, G., Georgiou, J., Oliveira, M. (2016) 'Female workers in textile and garment sectors in Sri Lankan Export Processing Zones (EPZs): gender dimensions and working conditions', *Sri Lanka Journal of Social Sciences*, 38(1), pp. 63–77. doi: 10.4038/sljss.v38i1.7386.

Hancock, P., Middleton, S. and Moore, J. (2012) 'Gender, globalisation and empowerment: a study of women who work in Sri Lanka's Export Processing Zones', *Work Organisation, Labour & Globalisation*, 6(1), pp. 131–146. doi: 10.13169/workorgalaboglob.6.1.0131.

Hari Tv (2020) සමහරු කොස් ඇට කාලා වතුර බිව්වාග කාන්තාවන්ව විවිධ දේවල් වලට භාවිතා කලා - හෙළිදරව්ව [Hari Tv]. Available at: https://www.youtube.com/watch?v=ekkeroK92FM (Accessed: 24 July 2021).

Harvey, D. (2007) *A Brief History of Neoliberalism*. Oxford: Oxford University Press.

Hewamanne, S. (2003) 'Performing "Dis-respectability": New Tastes, Cultural Practices, and Identity Performances by Sri Lanka's Free Trade Zone Garment-Factory Workers', *Cultural Dynamics*, 15(1), pp. 71–101. doi: 10.1177/a033109.

Hewamanne, S. (2017) 'Toward Meaningful Health and Safety Measures: Stigma and the Devaluation of Garment Work in Sri Lanka's Global Factories', in Prentice, R. and De Neve, G. (eds) *Unmaking the Global Sweatshop*. Philadelphia: University of

Pennsylvania Press, pp. 226– 250. Available at: https://www.degruyter.com/document/ doi/10.9783/9780812294316-010/html (Accessed: 24 July 2021).

Hewamanne, S. (2018) 'Sewing their way up the social ladder? Paths to social mobility and empowerment among Sri Lanka's global factory workers', *Third World Quarterly*, 39(11), pp. 2173–2187. doi: 10.1080/01436597.2018.1458302.

Hewamanne, S. (2019) 'Crafting social change: former global factory workers negotiating new identities in Sri Lanka's villages', *Identities*, 26(2), pp. 165–183. doi: 10.1080/1070289X.2017.1380942.

Hewamanne, S. (2020) 'From global workers to local entrepreneurs: Sri Lanka's former global factory workers in rural Sri Lanka', *Third World Quarterly*, 41(3), pp. 547–564. doi: 10.1080/01436597.2019.1675504.

Hewamanne, S. (2021) 'Pandemic, Lockdown and Modern Slavery among Sri Lanka's Global Assembly Line Workers', *Journal of International Women's Studies*, 22(1), pp. 54–69.

Jayawardena, D. (2018) 'Patriarchy and (Un)Doing Factory of Women's Collective Identity in Sri Lanka's Localised Global Apparel Industry: The Glass Ceiling Revisited', in Mahtab, N. et al. (eds) *Handbook of Research on Women's Issues and Rights in the Developing World*. IGI Global, pp. 19–36. doi: 10.4018/978-1-5225-3018-3.ch002.

Jayawardena, D. (2020) 'Other's Place or Othering Space Reframing the Performativity of the Neoliberalized Space(s) of Factory Women in a Free Trade Zone in Sri Lanka', *Gender in Management: An International Journal*, 35(5), pp. 405–421.

Jordal, M., Öhman, A. and Wijewardene, K. (2020) 'Respectability and rights. Sexual and reproductive health and rights of Sri Lankan women formerly involved in prostitution', *Contemporary South Asia*, 28(1), pp. 28–42. doi: 10.1080/09584935.2019.1667301.

*Liberation Movement on Facebook Watch* (2021). Available at: https:// www.facebook.com/LiberationMovementLka/videos/noteven-13-of-the-working-class-has-been-given-the-

covid-19- vaccine-as-yet-on-o/323307655890361/ (Accessed: 24 July 2021).

Perera, W. and Fernando, K. (2020) Sri Lankan free trade zone employees told to keep working as infections rise, *World Socialist Web Site*. Available at: https://www.wsws.org/en/articles/2020/10/17/coro-o17.html (Accessed: 24 July 2021).

Ruwanpura, K. N. (2012) *Ethical codes: reality and rhetoric-a study of Sri Lanka's apparel sector. University of Southampton*. Available at: https://core.ac.uk/download/pdf/8747298.pdf (Accessed: 24 July 2021).

Ruwanpura, K. N., Gunawardana, S. and Padmasiri, B. (2021) 'Vaccine Inequality and the Cost to Garment Sector Workers', *Groundviews*, 22 May. Available at: https://groundviews.org/2021/05/22/vaccine-inequality-and-the-cost-to-garmentsector-workers/ (Accessed: 24 July 2021).

Skanthakumar, B. (2017) *Living for the day': Contract Workers in Sri Lanka's Free Trade Zones*. Katunayake: Dabindu Collective.

*Sri Lankan garment workers decry violations of labor rights - UCA News* (2020) *ucanews.com*. Available at: https://www.ucanews.com/news/sri-lankan-garment-workers-decry-violations-oflabor-rights/89988 (Accessed: 24 July 2021).

*Sri Lanka's apparel industry attracts over 500 mln USD orders for PPE* (2020) *Xinhua News*. Available at: http://www.xinhuanet.com/english/2020-05/22/c_139079934.htm (Accessed: 24 July 2021).

*UN(DER) PAID IN THE PANDEMIC: An estimate of what the garment industry owes its workers* (2020) Clean Clothes Campaign. Available at: https://cleanclothes.org/file-repository/underpaid-in-the-pandemic.pdf.

Wijesinghe, R. (2020) 'Sri Lankan garment workers face difficulties during and after COVID-19 curfew', *Praja*, 3 June. Available at: http://praja.lk/english/sri-lankan-garment-workers-facedifficulties-during-and-after-covid-19-curfew/ (Accessed: 24 July 2021).